**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය (IFB)

## පු.ලි.දෙ. ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හා ප්‍රාදේශීය ඒකකවල Dell OptiPlex වර්ගයේ පරිගණක යන්ත්‍ර 1067 ක් වසරක කාලයක් සඳහා සේවා හා නඩත්තු කිරීම

**IFB අංකය : *DRP/ACC/07/41/2025-26***

01. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **පු.ලි.දේ. ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හා ප්‍රාදේශීය ඒකකවල Dell OptiPlex වර්ගයේ පරිගණක යන්ත්‍ර 1067 ක් වසරක කාලයක් සඳහා සේවා හා නඩත්තු කිරීම** වෙනුවෙන් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

02. මෙම ලංසු කැඳවීම **ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය** අනුව සිදු කෙරේ. (NCB)

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, වැඩ කරන දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා **පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී** වෙතින් දුරකථන අංක **011-5226172** ඔස්සේ වැඩිදුර තොරතුරු ලබාගත හැකිය. ලංසු ලේඛන **2026.04.02** සිට **2026.04.21** දින දක්වා **ගිණුම් අංශය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සී පර්යන්තය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙතින්** නොමිලේ පරීක්ෂා කළ හැකි අතර, එම ලංසු ලේඛනය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ද **(www.drp.gov.lk)** පළ කර ඇත.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **2026.04.02** සිට **2026.04.21** දක්වා **වැඩ කරන දිනවල පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා කාලය තුළ නැවත නොගෙවනු ලබන **ශ්‍රී ලංකා මුදලින් රුපියල් පන්දහසක (5,000/=)** ගාස්තුවක් ගෙවා ගණකාධිකාරී, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබා ගත හැකිය.

05. **2026.04.22** දින **ප.ව. 2.00 හෝ ඊට පෙර**, **"මුල් පිටපත"** සහ **"පිටපත"** ලෙස සටහන් කරමින්, පිටපත් දෙකින් යුතුව මුද්‍රා තැබූ එක් ලියුම් කවරයක බහා 3 ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලංසු ලැබෙන්නට සැලැස්විය යුතුය. නැතහොත් **ගිණුම් අංශය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සී පර්යන්තය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයේ සිට **දින හැත්තෑ හතක (77)** කාලයක් හෝ ගැනුම්කරු විසින් දීර්ඝ කරන දිනයක් දක්වා ලංසු වලංගු විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ලබාගැනීම අවසන් වූ වහාම පැමිණීමට අපේක්ෂා කරන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

06. ලංසුව බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ ලංසු කැඳවීමේ අංකය සඳහන් කළ යුතු ය. සියලුම ලංසු, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද **ශ්‍රී ලංකා රුපියල් එක්ලක්ෂ අසූ හත්දහස් පන්සියයක (187,500/-)** ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතුය. මුල් ලංසු සුරක්ෂණයක් සැපයිය යුතුය.

07. තෝරාගන්නා ලංසුකරු **2026.05.27** දින සිට සේවාව ආරම්භ කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,**
**12 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**

SELACINE MEDIA SOLUTIONS